ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් ප
ක්‍රි. ව. 2013 දෙසැම්බර් 02 සඳුදා
06 වෙළුම - 05 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

# ළමා ප්‍රදීපය

LP - QD / 52/ News/ 2013

## දයාබර දරුවෙනි ! දැන් අපි
# මරිය වසරට
## සූදානම් වෙමු !



ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# දිව්‍ය සත්ප්‍රසාදයේ දශකය තුළ සිව්වන වසර "මරිය වසරයි"

## ආදරණීය දුවේ පුතේ...

දැන් "මරිය වසර" උදා වුනා. අපි අවසන් කළේ "විශ්වාසයේ වසරයි". මරිය වසර විශ්වාසයේ වසරට දිගුවක් ලෙස ගැලපෙනුයේ මරිය තුමිය විශ්වාසයෙන් පිරි දිවියට කදිම නිදසුනක් නිසා බව කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මරිය වසර සඳහාවූ නිකුත් කළ එඩේරික අනුශාසනා පත්‍රයෙහි පැහැදිලිව සඳහන් කර තිබෙනවා. අගරදගුරු පදවි අධ්‍යාත්මික පුනර්ජීවය සඳහා දියත් කරන ලද දිව්‍ය සත්ප්‍රසාදයේ දශකය තුළ ගත වන්නේ මේ සිව්වන වසර වන අතර එය "මරිය වසර" ලෙස අප ප්‍රකාශයට පත් කරන්නේ මහත් සතුටින් හා දෙවියන් වහන්සේගේ පියකරු උද්‍යානයේ සුපිපුන අභිරහස්‍යමය රෝස කුසුම වන ස්වර්ගීය මාතාවන්ට බැති පුද දෙමින් බව අමතක කරන්න එපා යන්න අගරදගුරු කාදිනල් හිමිපාණන් අපට සිහි කැඳවීමක් කරනවා. මේ වසර ආරම්භයත් සමඟම අපට එකට පෙළ ගැසෙන්නට කදිම ආරාධනාවක්ද තිබෙනවා. එහිදී කතෝලික අපි කිසිදු වයස් භේදයකින් තොරව එකට එකතු විය යුතුයි. එලෙස එකට පෙළ ගැසෙමින් මෙලෙස අයදින්නට ශක්තියක් ලබා ගත යුතුයි.

"මැණියෙනී, අහෝ ස්වර්ගීය මාතාවෙනි, ඔබ තුමියගේ දයාබර පුතණුවන් සමීපයට පැමිණීමට අපට උදව් කරමින් සහ ඔබ තුමියගේ මාතෘක මැදිහත්කම තුළින් ආත්මික සහ ශාරීරික ප්‍රීතිය අත් දකින්නටත්, ඔබ තුමියගේ ප්‍රේමණීය ආරක්ෂාව සහ රැකවරණයද ජීවිතයේ පරිපූර්ණ ශුද්ධවන්තභාවයද අත් දකින්නට අපට වරම් දුන මැනව". ආදර දුවේ පුතේ, මේ කුඩා යාච්ඤා ඉල්ලීම තුළ කතෝලික අපගේ විශ්වාසයේ පැවැත්ම සනිටුහන් වෙනවා. අපට ආරක්ෂාව අවශ්‍යයි. අපට රැකවරණය අවශ්‍යයි. ඒ පමණක් නොව අපට ජීවිතයේ පරිපූර්ණ ශුද්ධවන්ත භාවයද අත්‍යවශ්‍යයි. අපේ ගෙදර අම්මා අපට සලසා දෙන මේ සුරක්ෂිත භාවය අපි අත්දකින්නේ කෙසේද? ඒ අයුරින්ම පොදු පවුල රැකෂා කරන අපේ පොදු මාතාවන් අපට ඒ සියල්ල ලබා දෙන්නට අප වෙනුවෙන් මැදිහත් වන බව සම්පූර්ණයෙන්ම පසක් කර ගන්නට, මේ වසර තුළ ඒ වෙනුවෙන්ම ඒකාත්මික වන්නට කරන ආරාධනාව සුළු කොට තකන්න බැහැ නේද?

ඒ නිසාම ආදර දුවේ පුතේ, අගරදගුරු කාදිනල් හිමිපාණන්ගේ අනුශාසනා පත්‍රයේ සඳහන් වන අයුරින්ම දැන් අපට ප්‍රායෝගිකව ඉටු කරන්නට වැඩ කොටසක් පැවරෙනවා. එතුමියට කැප කළ මේ වසර පුරා දෙවියන්වහන්සේගේ ගැලවීමේ සැලසුම තුළ ඇය සම්පූර්ණ කළ අලංකාර කාර්යභාරය වැඩිදුරටත් අධ්‍යයනය කර ඉන් ශක්තිමත් වී ඇය වෙත අපි පෞද්ගලික හා පවුල් වශයෙන් දිනපතා ජපමාලය උච්චාරණය අත්‍යවශ්‍යයි, එලෙසම මේ වසර පුරා දේව මැණියන්ට කැප කර ඇති වන්දනා ස්ථාන කරා වන්දනා ගමන් යන්නට අපට විවෘත ආරාධනාවක් තිබෙනවා. නිරන්තර පාපොච්චාරණය සහ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම මගින් හා එතුමියගේ කැඳවීමට සවන් දෙමින් හදවත් වෙනස් කරගෙන, ස්වර්ගීය මාතාවන්ගේ ප්‍රෞඪ දූ පුතුන් ලෙස හද පත්ලෙන් නැගෙන "අම්මා" යන ආදරණීය ඇමතුමෙන් අමතන්නට අපි කටයුතු කළ යුතු වෙනවා.

දැන් ආදර දුවේ, පුතේ, මේ වසර තුළදී ප්‍රායෝගිකව ඉටු කරන්න ලබා දී ඇති වැඩ කොටස් අතර දරුවන් වන ඔබ මූලිකත්වය ගත යුතු බවටද මතක් කිරීමක් තිබෙනවා. දහම් පාසල් දරු දැරියන් හැටියට ගැලවීමේ ඉතිහාසය තුළමරිය මාතාවන්ගේ කාර්යභාරයේ වටිනාකම විශේෂයෙන්ම ශුද්ධ ලියැවිල්ල පාදක කර ගනිමින් සකස් කරන අත් පත්‍රිකා සහ අනෙකුත් පොත් දැන් හොඳින් පරිහරණය කළ යුතු වෙනවා. රචනා, ප්‍රශ්න, චිත්‍ර හා ගීත ගායනා ආදි ක්ෂේත්‍රයන්හි විශේෂ තරග සංවිධානය කිරීම් තුළින් කතෝලික සභාවේ මරිය බැතිය හා මරිය මාතා චරිතාපදනය පිළිබඳව දැනුම හා බැතිය නංවාලීමට කටයුතු කළ යුතුවෙනවා. එලෙසින්ම අපේ කතෝලික රජයේ හා පෞද්ගලික පාසල්වල පිහිටුවන්නට යන කණිෂ්ඨ මරිය හමුදාවට බැඳී මරිය බැතිය පිළිබඳව හොඳ අවබෝධයක් ඇති ජ්වලිත යෞවනයෙක් යෞවනියක් වන්නට උත්සහ කළ යුතු වෙනවා. එලෙසින්ම මේ වසර තුළදී ඒ ඒ පාසල් වල සංවිධානය කරන්නට බලාපොරොත්තු වන "මරිය රැළි" හා විශේෂාකාරයෙන් සම්බන්ධ වන්නට උනන්දු විය යුතු වෙනවා.

ආදර දුවේ, පුතේ, දැන් ඔබ හොඳාකාරවම දන්නා පරිදි ක්‍රිස්තියානි නමින් එන මූලධර්මවාදීන් පහර දෙන්නෙ මරිය වහන් සේටයි. අම්මා කෙනෙකුට පහර දීලා පුතෙක්ව අනුගමනය කරන්න පුළුවන්ද? මූලධර්මවාදීන්ගේ මේ ප්‍රයෝග හා වංචා වලට පිළිතුරු දෙන්නට හා මූලධර්මවාදය වෙත නොදැනුවත් කම නිසා ඇදී ගොස් ඇති ඒ පිරිස් නැවත හරි මඟට ගෙන ඒමට මරිය වසර තුළදී ඔබ සන්නද්ධව සිටීම ඇත්තෙන්ම අවශ්‍යයි. ඒ නිසා මේ වසර ඉතාමත්ම වැදගත් වසරක්. කතෝලික අනන්‍යතාවය පැහැදිලිවම විහිද හරින වසරක්. සම්ප්‍රදාය තුළ කතෝලික විශ්වාසය ජීවමාන කරවන වසරක්. මෙහි ප්‍රධාන කොටස් කරුවන් වන්නේ, ආදර දුවේ පුතේ, ඔබයි, දේව අම්මාගේ ලස්සන පින්තූර ඔබේ පාඩම් පොත් වල අලවලා දිනපතා ඒ දිහා බලාගෙන මේ වසර තුළදී අපට ලබා දී ඇති ඒ යාච්ඤාව උච්චාරණය කරමින් මේ මරිය වසර ආධ්‍යාත්මයේ පිරිපුන් වසරක් බවට පත් කර ගන්නට ඔබ එකට එකතු විය යුතුමයි.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**




**පසුගිය ලිපියෙන්**

❖ ප්‍රः ශුද්ධවූ පේදුරු තුමන් වෙනුවෙන් ශුද්ධවූ සභාවට නායකයා වී සිටින්නේ කවුද?

උः ශුද්ධොත්තම පියතුමෝය.

❖ ප්‍රः ශුද්ධවූ පේදුරු අපෝස්තුළු තුමන්ට දී තිබුණු ඉහත කී වරම් හා බලය ශුද්ධොත්තම පියතුමන්ට ලැබී තිබේ ද?

උः එහෙයි, ශුද්ධවූ පේදුරු අපෝස්තුළු තුමන්ට දී තිබුණ එම වරම් සහ එම බලය ශුද්ධොත්තම පියතුමන්ටද ලැබී තිබේ.

❖ ප්‍රः අනෙක් අපෝස්තුළුවරුන් වෙනුවෙන් සිටින්නෝ කවුරු ද?

උः රාජගුරු ප්‍රසාදිවරුන් ය.

❖ ප්‍රः ජේසු ස්වාමිදරුවන් විසින් ශුද්ධවූ සභා කීපයක් ස්ථාපනය කරන ලද්දේ ද?

උः නැත කතෝලික කියනු ලබන පොදුවූ එකම ශුද්ධවූ සභාව පමණක් ස්ථාපනය කරන ලද්දේය.

## මනුෂ්‍යයාගේ අන්තිම

❖ ප්‍රः මනුෂ්‍යයාගේ අන්තිම මොනවා ද?

උः මනුෂ්‍යයාගේ අන්තිම නම් මරණය, විනිශ්චය, ස්වර්ගය. නිරය යන මේවා ය.

❖ ප්‍රः මරණය ගැන සිහිකළ යුතු කරුණු මොනවා ද?

උः සෑම මනුෂ්‍යයෙකුම මැරෙන බව ද, ශරීරයෙන් වෙන් වූ ආත්මය දෙවියන් වහන්සේ වෙත නැවත යන බව ද යන මේවා ය.

❖ ප්‍රः මැරුණු වහාම ඔබේ ආත්මයට කුමක් සිදු වන්නේ ද?

උः විනිශ්චය පිණිස ජේසු ස්වාමිදරුවන් ඉදිරියෙහි පෙනී සිටීම ය.

❖ ප්‍රः ජේසු ස්වාමිදරුවන් කුමක් ගැන විනිශ්චය කරන සේක්ද?

උः එකිනෙකාගේ කල්පනා, වචන, ක්‍රියා සහ අතපසු කිරීම් යන මේ සියල්ල ගැන විනිශ්චය කරන සේක.

❖ ප්‍රः ඉන්පසු ජේසු ස්වාමිදරුවෝ කුමක් කරන සේක් ද?

උः වෙනස් කළ නොහැකි තීන්දුවක් එකිනෙකාට දෙවා වදාරණ සේක.

❖ ප්‍රः තීන්දුව අනුව ස්වර්ග රාජ්‍යයට යන්නෝ කවරහු ද?

උः දේව ඉෂ්ට ප්‍රසාද ජීවිතය ඇතිව පවු ණය සම්පූර්ණයෙන් ගෙවා සිටින ආත්මයෝ ස්වර්ග රාජ්‍යයට යන්නෝ ය.

❖ ප්‍රः ස්වර්ග රාජ්‍යයෙහි ඇති සැපත කුමක් ද?

උः ජේසු ස්වාමිදරුවන් සමගද, කන්‍යා මරියාවන් සමග ද දේවදූතයන් හා සියලු ශුද්ධවන්තයන් සමග ද දේව දර්ශනය භුක්ති විඳීම ය.

## භාවනා කරමු

### නිහඬ යාච්ඤාවට අත්‍යවශ්‍ය "අවධානය යොමු වීම"

ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවිදි සොයුරිය විසිනි



අප මොහොතක් නිහඬව සිටියොත් අපගේ සිතිවිලි සැමවිට යොමුවන්නේ අතීතයට හෝ අනාගත සැලසුම් හා සිහින කෙරෙහිය. නිහඬ යාච්ඤාව භාවනාව තුළින් යොමු වීමට වර්තමානය කෙරෙහි අවධානය යොමු කර සිටීම අත්‍යවශ්‍යයි.

එබැවින් මෙම ලිපි පෙළ අවසන් කිරීමට පෙර ප්‍රායෝගිකව එය පුහුණු කර ගත හැකි ක්‍රම කිහිපයක් ඔබ සමග මෙලෙස බෙදා ගනිමි.

1. තමන් එදිනෙදා කරන ඕනෑම දෙයක් සිහිකල්පනාවෙන් කරන්න. උදා:- මම මේ වෙලාවේ පාඩම් කරනව. හෝ ඇවිදිනවා හෝ සෙල්ලම් කරනවා.

2. විවේකී වේලාවක ඔරලෝසුවේ තත්පර කටුව දෙස බලාගෙන (තත්පර කටුව 12 ඉලක්කම ළඟටආ විට) 1-60 දක්වාත්, 60-1 දක්වාත්, (59,58,57 ආදි වශයෙන්) තත්පර කටුවත් සමග අවධානය යොමු කරමින් විනාඩි දෙකක් ගණන් කරන්න.

3. ඔබගේ අවධානය දෙමින් සිහිකල්පනාවෙන් දිනපතා සුළු වේලාවක් ශාරීරික ව්‍යායාම කරන්න පුරුදු වන්න.

4. පහසු ඉරියව්වක ඉඳගෙන හිසේ සිට පාද දක්වා ඇති ශරීර අවයව කෙරෙහි අවධානය යොමු කරන්න. ඔළුව, ඇස් දෙක, නාසය, කට, කන් දෙක, බෙල්ල, උරහිස්, අත් දෙක, පපුව , බඩ, කොඳු ඇට පේලිය, කකුල, පාද ආදි වශයෙන්

# මරිය වසර






මේ වන විට ළමා ඔබ පාසල, පවුල හා පරිසරය ඇසුරින් මරියොත්තමාවන් පිළිබඳව දැන උගත් කරුණු රැසක් ඒකරාශී වී ඇතිවාට සැක නැත. ''ජම්ම දෝෂයෙන් පිළිසිඳුනු මරිය තුමිය '' දෙවිමහෝත්තමයන් විසින් සිය ඒක ජනිත පුත්‍රයාණන් වන ජේසු සමිඳුණන්ගේ ප්‍රේමනීය මව වීමට තෝරා ගැනීමම එතුමියගේ ශ්‍රේෂ්ඨත්වය කියා පාන කරුණක් වන්නේමය.

කුමරි මරියාවන් ලොව පුරා විවිධ ස්ථාන වල දර්ශනයවී ඉල්ලා සිටියේ පශ්චත්තාප වී දෙවි සමිඳුන් වෙත හැරී එන්න, ජපමාලය උච්චාරණය කරන්න''යි කියාය.

අද දේව ජනතාව අතර පෙර කලදී මෙන් ''ජපමාලය '' උච්චාරණය නොකෙරෙන තත්ත්වයක් පෙනී යන බව සත්‍යයකි. අප ළමා වියේ, සන්ධ්‍යා සාමයේ දෙමාපියන් විසින් ගෙය මැද සාලයේ ජපමාලය උච්චාරණය කිරීම අපට හුරු කිරීම, අදත් ඊට යොමු වීමට අපට කදිම පූර්වාදර්ශයක් විය.

අද ජපමාලය තමන් සමඟ තබා ගන්නා පාසල් දරුවන් වෙතොත් ප්‍රතිශතයක් හැටියට සුළු පිරිසක් විය හැකිය. ජපමාලය දෙව්මවුන් අපට දුන් යාච්ඤා දමයකි. අඩ පැයක් දෙවිඳු නමදින්නට පවුලේ සාමාජික සාමාජිකයන් යොමු කරගන්නට ඔබට හැකිය. ඔබ උත්සහකරන්න.

''මරිය වසර'' උදා වී ඇත, ළමා ඔබ ඊට අනුගත වන්න, මරිය තුමිය ගැන ලියා ඇති පොත පත සොයා කියවන්න. ජීවිතය එමගින් සුවඳවත් කරගන්න. මරියාවෝ ඔබ පවුලම සුරකිනු නොඅනුමානය මරියාවන් මඟින් දෙවිඳුන් වෙත හැරෙන්න. ඔබට මරිමව් සරණයි

**ඩික්සන් ඇන්ටනි මාමා - පේරලන්ද**

## දේශකයකු ලෙසින් වැඩමුළු සියයක් මෙහෙයවයි



පාසල් වියෙහිදීම ළමා ප්‍රදීපය තිඹිරිගෙය කරගනිමින් ලේඛන කලාවට පිවිස අද එම පුවත්පතෙහිම සහය සංස්කාරක ලෙසින් කටයුතු කරන කුමර නයනජිත් මහතා මාධ්‍ය ජීවිතයේ සුවිශේෂී වූ අවස්ථාවක් සනිටුහන් කළ බැව් ඥානාර්ථ ප්‍රදීපය ඇතුළු තවත් පුවත්පත් වල පළවී තිබිණි. ඒ දේශකයකු ලෙසින් ලේඛක හා පෝෂක වැඩමුළු 100 ක් මෙහෙයවීමයි.

විශේෂයෙන්ම රදගුරු පදවි ගණනාවකම ළමුන්ට ලේඛන කලාව කියා දෙමින් ඔවුන්ව ඒ සඳහා උනන්දු කරමින් අංකුර ලේඛක ලේඛිකාවන්ට අතහිත දෙමින් නව පරම්පරාවක් බිහිකිරීමට කුමර මහතා දරන වෑයම ප්‍රශංසනීයය. මෙය ඇගයීමට ලක්විය යුතු අමිල මෙහෙවරකි.

වාද්දුව මීසමේ දහම් ගුරුවරයකු ලෙසින් විශිෂ්ට සේවාවක නිරත වූ මොහු මීසම් සේවක ගරු පියතුමන්ලා තිදෙනෙකු යටතේ කටයුතු කරමින් ළමුන්ගේ හා විශේෂයෙන් දෙමාපියන්ගේද ප්‍රසාදය දිනූ අයෙකි. මාධ්‍යවේදියකු ලෙසින් ඔබ ආ ගමන අප මීසමට ආඩම්බරයකි. ගෞරවයකි. දේශකයකු ලෙසින් කරනා මා හැඟි සේවාව සාර්ථකව කිරීමට ඔබට දෙව්මව් ආශිර්වාදය බහුලව ලැබේවායි පතමි. හිතවත් කුමර, ඔබගේ මාධ්‍ය දිවියට අපි හදවතින්ම සුබ පතමු.

**තුෂාර සුරංග පෙරේරා**
**විදුහල්පති**
**සා. මරියා දහම් පාසල - වාද්දුව**

## අද සමාජය

මිහිදිරියේ පින්න රැඳී
රෝස මල් කැකුළු මෙනි
විකසිතව හිනැහෙන්න
වෛර දරන පුංචි ඔබ දෙස

යොමාගෙන රකුසු නනෙත්
මානගෙන ඇඩි දැත්
ඩැහැගන්න ඔබේ ගත
මාන බලමින් දුදන

**ප්‍රියංගනී පෙරේරා**
ප්‍රධාන ආචාරිනී
ශා. මරියා දහම් පාසල - වැල්ලවාය

''නොවැම්බර් මාසය''
ළමා ප්‍රදීපය, අංක 02, , ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

මාසික සිතිවිල්ල



**සේයා :- අශේන් එස්. සේනාරත්න**

**ජයග්‍රාහි නිර්මාණ ලබන සතියේ**

# සිතේ වේදනාවට දෙවිඳුන්ගෙන් සහනයක්

**මේ ලෝකයේ ජීවත් වන සියලු දෙනාටම වේදනාව යන හැඟීම නොඅඩුවම දැනී ඇති බව නොරහසකි. විවිධ වූ ගැටලුවලට මුහුණ දෙන අපි ඒ ඒ ප්‍රශ්න හමුවේ ඇද වැටෙන්නේ නැවත කිසිමදාක පය ගසා නැගිටීමට නොහැකි ලෙසයි. නමුත් හිත මිතුරේ ඔබ වරක් සිතුවාද, ඇයි ඔබ වේදනාවට පත් වන්නේ කියා?.**

එයට පිළිතුරක් නැතැයි ඔබට දැන් සිතෙනවා විය හැකියි. නමුත් බලන්න ඔබේ ජීවිතය දෙස හැරී ඔබට එවැනි ගැටලුවක් ඇති වූ අවස්ථාවක් ගැන සිතන්න. ඔබ ඇයි එලෙස වේදනාවට පත් වූයේ කියා. සිතට ඇයි එතරම් දුකක් දැනුණේ කියා.

නමුත් සිතන්න , ගංගාවක් ඔහේ ගලාගෙන යන විට හරිම ඒකාකාරියි. එහි කිසිදු සුන්දරත්වයක් නොමැත. නැතිනම් එහි වූ සුන්දරත්වය ඉස්මතු නොවනු ඇත. නමුත් ඒ ගංගාවම ගල්කැට අතරින් කලුගල්වල හැපී , පුංචි කටුක දිය පාරවල් අතරින් රිංගා ගලා යන විට ඉන් ඉස්මතු වන්නේ හිතාගන්නවත් බැරි අලංකාරයකි. අපේ මේ මිනිස් ජීවිතයද සැබවින්ම ඒ වගේය.

අප සිතනුයේ ජීවිතයේ සුන්දරත්වය යනු සතුට, විනෝදය ධන සම්පත් පමණක්ම බවයි. නමුත් ඔබ සිතා ඇති සතුටු වූ පමණින්ම ජීවිතයක් සුන්දර නොවන බව. වේදනා තුළින් අප ලබන අත්දැකීම අපට වෙන කිසිම දෙයකින් හිමි නොවේ.

ස්වභාවයෙන්ම දෙවියන් වහන්සේ අප මවා ඇත්තේ වේදනාවද උරුම කරවමිනි. අපට පැමිණෙන වේදනා අප ඉවසා දරා ගත යුතුය. නමුත් දැන් ඔබට සිතෙයි, සෑමදාම මේ සිත තුළ සිරවුණ වේදනාව හිමි වන්නේ මටම විතරක්ද කියා.

එය නොවේ සැබෑ සත්‍යය. ඔබට පමණක් නොව අප සියල්ලන්ටම එය නිතැතින්ම හිමි වේ. දෙවියන් තුළ ජීවත් වන්නාට එයින් ඉක්මනින් නිදහස් විය හැක. ඒ වේදනාව තුළින් ලබාගත් අත්දැකීමෙන් සතුට සොයාගත හැක. එයට අපට සහය වන්නේ සර්වබලධාරී වූ දෙවියන් වහන්සේය. යාච්ඤාව තුළ නිතරම ජීවත් වන්න. එවිට වේදනාව නම් වූ අභියෝගයට අභියෝගයක් වීමට ඔබට හැකි වනු ඇත.

අපේ මිනිස් ජීවිතේ සතුට යනු දෙවියන් වහන්සේය. සිතන්න, හැරී බලන්න, ඔබට වේදනාවක් ගෙන දුන් මොහොතක ඔබ සිටියේ කා සමගද යන්න. ''දෙවිඳුන් සමඟ සිටින්නා සැම විටම සැපතට උරුමකම් කියයි'' මේ වදන නිතරම ඔබේ මනසේ රඳවා ගන්න.

අපි සියල්ලන්ගේම සිත් තුළ සිරවී ඇති වේදනා දෙවියන් වහන්සේගේ පාමුල තබා සිතට සහනයක් ඔබත් ලබා ගැනීමට උත්සහ කරන්න.

**කේ.ඒ. නිම්නාදි රොද්‍රිගෝ**
**12 ශ්‍රේණිය**
**සිරිකුරුස විදුහල - ගම්පහ**

# හලාවත සාන්ත මරියා ප්‍රාථමික බාලිකා විදුහලෙන් විවිධ ප්‍රසංගයක්



හලාවත සාන්ත මරියා ප්‍රාථමික බාලිකා විදුහලේ සිසුවියන්ගේ කුසලතාවයන් එළිදැක්වූ ''දිදුලන තරු කැකුළු'' විවිධ ප්‍රසංගය පසුගියදා පැවැත්වුණි. හලාවත රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්,ප්‍රවීන චිත්‍රපට අධ්‍යක්ෂ සෝමරත්න දිසානායක මහතා ඇතුළු බොහෝ පිරිසක් මීට එක්වූහ. මෙදින අවස්ථාවන් සේයා රුවෙහි දිස්වේ.

# වයස 19 න් පහළ අන්තර් පාසල් පැසිපන්දු ශූරතාවය මෝදර ද ලාසාල් විදුහලට




2013 අන්තර් පාසල් පැසිපන්දු ශූරතාව දිනා ගැනීමට මෝදර ද ලාසල් විදුහලේ වයස අවුරුදු 19 පහළ පැසිපන්දු ක්‍රීඩකයෝ සමත් වූහ. ජයග්‍රාහී පැසිපන්දු කණ්ඩායම ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයා රුවකට මුහුණ දුන් අයුරු.

**රනිල් රාජපක්ෂ**

## ගායනා තරගයෙන් බස්නාහිර පළාතෙන්ම පළමු වැනියා



2013 සමස්ත ලංකා පාසල් සංගීත තරගයේ, බස්නාහිර පළාත් ''ඒකල නව නාට්‍ය ගී ගායනා තරග '' අංශයේ පළමු ස්ථානය දිනාගැනීමට මොරටුව , කොරළවැල්ල රෝමානු කතෝලික විදුහලේ ඩබ්ලිව්. ෂයිනි අංජලිකා ප්‍රනාන්දු සිසුවිය සමත්වූවාය.

අංජලිකා දියණිය 7 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර දෙව්මැදුරේ ගායනා කණ්ඩායමේ සාමාජිකාවකි. ඇයට ළමා ප්‍රදීපය සුබ පැතුම්

**ඩබ්ලිව්. තිලක් ප්‍රනාන්දු**

## රචනා ලිවීමට දක්ෂ සිසුවියක්




කොළඹ අගරදගුරු පදවියේ ධර්මදූත ළමා සමාජය අරඹා වසර 25 ක් පිරීම නිමිත්තෙන් පැවැත්වූ තරගා වලියේදී රචනා අංශයෙන් වයස 12 න් පහළ දෙවැනි ස්ථානය දිනා ගැනීමට බත්තරමුල්ල පාතිමා දහම් පාසලේ මනුති වරසිංහ ශිෂ්‍යාව සමත්වූවාය. ඇය ලැබූ සහතික පත්‍රය සමග ළමා ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු. **කුමර**

## මළල ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණයක්



පානදුර යහපත් එඬේරා කන්‍යාරාම විදුහලේ, අ.පො.ස. (උ.පෙළ) වාණිජ අංශයෙන් අධ්‍යාපනය ලබන සයෝනා චාමිකා සිසුවිය පසුගියදා පැවති ඉන්දියාවේ සාංචිනගර් හි පැවති කණිෂ්ට දකුණු ආසියානු මළල ක්‍රීඩා තරගයට ශ්‍රී ලංකා පිල නියෝජනය කරමින් හෙල්ල විසිකිරීමේ තරග ඉසව්වෙන් දෙවන ස්ථානය ලබා ගනිමින් රිදී පදක්කමක් හිමිකරගත්තාය. සයෝනා චාමිකාට ළමා ප්‍රදීපය සුබ පැතුම්!

**✍ භාෂිනි පීරිස්**

### ළමා ප්‍රදීපය නත්තල් කලාපයට නිර්මාණ එවන්න.

**ළමා ප්‍රදීපය විශේෂ නත්තල් කලාපය සඳහා නත්තල හා බැඳි ඔබගේ නිර්මාණ (සඳැස්, නිසඳැස්, ලිපි, කෙටි කතා, චිත්‍ර) අප වෙත යොමු කරන්න. ඔබගේ නිර්මාණ 2013 දෙසැම්බර් 10 වන දිනට පෙර, ළමා ප්‍රදීපය "නත්තල් කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.**

සංස්කාරක පියතුමා

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 34

## රෙපරමාදු ආභාෂයෙන් බිහි වෙන නව චින්තන රටා

පසුගිය ලිපිය හා සබැඳේ

**14 වෙනි ලුවී රජතුමා (1638 - 1715)**

විසෙන්ති තුමා තම ජීවිතය අවසන් කරන විට ප්‍රංශයේ ප්‍රබලතම රජ වීමට නියමිතව සිටි 14 වෙනි ලුවී රජ තවමත් තරුණ වියේ විය. එතුමාගේ පියා වූ 13 වෙනි ලුවී රජ යුරෝපයේ ප්‍රධානතම රට බවට පත්වීමට ප්‍රංශයට අවශ්‍ය වූ අඩිතාලම සිය ජීවිත කාලයේදීම දමා තිබුණේ ය. ඊට උචිත වූ පරිසරය විසෙන්ති තුමා විසින් සකස් කරනු ලැබුණායැයි ද කිව හැකිය.

ප්‍රංශය අවිවාදයෙන්ම යුරෝපයේ ප්‍රධානතම රට බවට පත්වූයේ 13 වෙනි ලුවී රජතුමාගේ කාලයේදීය. ඔහු විසින් ගෙන ගිය රාජ්‍ය පාලන කාර්යයේ ප්‍රතාපවත් භාවය නිසා ''හිරු රජු'' '' (Le roi soleit) යන නමින් ද ඔහු හැඳින්වෙන්නට විය. එසේ වුවද සාමාන්‍ය චර්යාව අනුව ගත් විට ඔහු එතරම් අසමාන්‍ය කෙනෙකු නොවීය. සොල්දාදුවෙකු වශයෙන් වේවා පාලක කටයුතු සැලසුම් කරුවෙකු වශයෙන් වේවා ඔහු වෙනත් බොහෝ අයට වඩා වෙනස් නොවී ය. ක්‍රිස්තු භක්තිකයකු වශයෙන්ද මනුෂ්‍යයකු වශයෙන්ද සැලකිල්ලට ගත යුතු තරමේ විශේෂත්වයක් ඔහු තුළ වූයේ නැත. එහෙත් ඔහු විශිෂ්ට රජ කෙනෙකු විය. රජකම දරන්නෙක් වශයෙන් ඔහු සතුවූ දක්ෂතා අසාමාන්‍ය විය. රටේ හැම දෙයක්ම ඔහු වටා කරකෙවෙන්නට සැලැස්වීමට ඔහු අතිශයින් සමත් විය.

ඔහු තම පාලනයේ ලාංඡනය මුළු රට තුළමද, ඔහු අයත්වූ යුගය තුළද කිසිදු නොමැකෙන විලාශයකට සනිටුහන් කර තැබීමට තරම් බලවත් විය. ඔහු හැම දෙයක්ම කළේ ගාම්භීරව ය. රාජකීය විලාශයකට, චාරිත්‍ර සම්පන්නව ය. ඔහු ඉහළ පෙළේ කලා කරුවන්ද ගොඩනැගිලි සැලසුම්කරුවන්ද, නාට්‍යකරුවන්ද, ධර්මදේශකවරුන්ද, තම මාලිගයට ඇද ගැනීමට සමත් විය. කිසිවෙක් කලින් නොසිතූ තරමේ රාජ්‍ය නිවාස ඔහු තැනුවේ ය. ''වර්සායි'' (Versailles) මාලිගාව ඔහු විසින් තනන ලද්දේ එක පැත්තකින් රටේ ලොකුකම ලොවට කා වැද්දීමට ය. අනික් පැත්තෙන් පාලකයාගේ ලොකුකම රටට කාවැද්දීමට ය. ඔහු බොහෝ විට එක් එක් දේ කෙළේ ''තමා ප්‍රංශය'' යැයි ''ප්‍රංශය තමා යැයි'' යන හැඟීමකින් ය. ඒ බව සනාථ කරමින් ඔහු වරක් ''ප්‍රංශ රජය මමයැයි'' කියා ප්‍රසිද්ධියේ පැවසී ය. ආගම ගැන ඔහු දැරූ මතයද ඊට වඩා වෙනස් වූවා වන්නට බැරි ය. ''ක්‍රිස්තියානි ශාසනය මමයැ''යි ඔහු කිවේ නැත. එහෙත් ක්‍රිස්තියානි ශාසනය ගැන ඔහු ක්‍රියා කෙළේ එසේ සිතූ විලාශයකට ය.

කෙසේ වෙතත් තිස් අවුරුදු යුද්ධය අවසන් වී 19 වෙනි ශත වර්ෂය ආරම්භ වන තෙක්ම යුරෝපයේ මුල් තැන ගත් රට ප්‍රංශය විය. ඒ තැන එයට ලබා දුන්නේ 14 වෙනි ලුවී රජම බවටද සැකයක් නැත. ඔහු රජකමට පත් වූයේ 1643 දී ඔහුට වසර ක් වී තිබියදී ය. එතැන් සිට 1715 දී සිදුවූ ඔහුගේ මරණය දක්වා අවුරුදු 72 ක් ඔහු එක දිගටම ප්‍රංශයෙහි රජ කෙළේ ය. එතරම් දීර්ඝ කාලයක් වෙනත් කිසිම කෙනෙක් රටක් පාලනය කර ඇත්දැයි සැක සහිත ය.



**ජැන්සෙනිස්ත වාදය**

ජැන්සෙනිස්ත වාදය ඇරඹුණේ කුමන ආගමික හා දේශපාලන වාතාවරණයකින් යුතු ප්‍රංශයකද කියා තේරුම් ගැනීමට සාන්ත විසෙන්ති තුමා ගැනද 14 වෙනි ලුවී රජතුමා ගැනද ඉහත දැක්වුන කරුණු ප්‍රයෝජනවත් වනු ඇත. කලින්ද දැක්වුන පරිදි ජැන්සනිස්ත වාදය රෙපරමාදු විප්ලවයේ ආභාෂයෙන් ඇති වුවක් වුවද රෙපරමාදු සම්ප්‍රදායට අයත් වෙනම සභාවක් නොවී ය. එය කතෝලික බැතිමතුන් කණ්ඩායමක් අතර ක්‍රියාත්මක වූ නව චින්තන රටාවක් පමණි.

දළ වශයෙන් ගත් විට රෙපරමාදු විප්ලවය දියත් කළ නායකයින්ගේ චින්තාවලියට ආකල්ප දෙකක් මූලික වුවායැයි කිව හැක. එකක් මිනිසාගේ පුද්ගලික බුද්ධියටද ස්වාධීනත්වයට ද ගරු කළ යුතු යැයි යන අදහස ය. මිනිසා හා දෙවියන් අතර ගනුදෙනුවට පාලක කිසිවකුගේ මැදිහත් වීමත් අවශ්‍ය නොවේ යැයි මොව්හු පිළිගත්හ. රෝමයේ මධ්‍යගත පාලන ක්‍රමය ප්‍රතික්ෂේප වූයේ එම නිගමනය මත ය. නිදහස ගරු කරන කවරෙකු විසින් වුවද එය සහන දායක අදහසක් සේ සැලකෙන්නට පුළුවන

ඉදිරියට .......

**සංස්කාරක පියතුමන් විසිනි**

# ආදර දේව අම්මා



මාගේ ජීවිතයේ රැජිණ ඔබයි
මා දිවියට ආලෝකය ඔබයි
මා හට ඇති එකම සවියද ඔබයි
දේව අම්මේ ........
දුක් වේදනා, සියළු
පාප පරීක්ෂා වලදී
දෙවිපියාණන් ඉදිරියේ
වෙනුවෙන්
මැදහත් වන, මැදිහත්කාරිය ඔබයි
ඔබ තුමියගේ මාතෘක
සළු සෙවන තුළ
අප රැකගත මැනවි.........

**සිකිලා ජයාංගනී ජයකොඩි**
**13 ශ්‍රේණිය**
**දංකොටුව බාලිකා මහ විදුහල**

# මිදි වැල උපමාවෙන් පුංචි අපට පණිවුඩයක්......

මිදි වැල උපමාවට අනුව ක්‍රිස්තුන් වහන්සේ අප සැම ඵල දැරීම සඳහා කැඳවනු ලබයි.අප ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම් බොහෝ ඵල දැරිය හැක. ක්‍රිස්තුන් වහන්සේ අපය ඉගැන්වූ දේව පනත් නිසියාකාරව පිළිපැදීමෙන් උන්වහන්සේ සමග ඇති දේව සබඳතාව වර්ධනය කර ගත හැක.

**තනුෂි විහංගනා ප්‍රනාන්දු**
**09 ශ්‍රේණිය**
**ක්‍රිස්තුරජාණන්ගේ දහම් පාසල - බිංගිරිය**

# නොනිමි මව් සෙනෙහස



මගේ සියලු දුක් වලදී
පිළිසරණය ඇය වූවා
මේ සියලුම දේ හින්දා
සැමදා මා ණයගැති වෙමි.....

**කවිතා නෙත්මි ප්‍රාර්ථනා**
**08 ශ්‍රේණිය**
**ශා. ලාසරස් දහම් පාසල - දෙමටපිටිය (කටුනේරිය මීසම)**




# නියඟය

වැහි පොදක් නොදුටු පොළොව
ඉරි තලා ඇත දුක් බරව ගහකොළ
වියළී ඇත ගම්මානේ ලස්සන කර
ගලාගිය දියපාර නැත අද දකින්නට

නියඟය නිසා දුක් විඳිනා සැමටම
සතුටු වන්නට නියඟය නිමවී ඉක්මනින්ම
වැස්ස ලැබේවායි මා පතමි.

**ඈන් මහිෂා**
**08 ශ්‍රේණිය**
**පුත්කන්දලය රජයේ සිංහලවිදුහල**
**සිංහපාඩුව, (කොන්තන්තිවු)**

# බරවූ කුරුසිය




පියාණනී,
මීට වඩා මට දරා ගන්න
නොහැකියි
මා බියගුල්ලෙකු සේ වෙමි.
මම මෙසේ ඔබගෙන්
අයදිමි
ඇණ වලින් සිදුරු වූ ඔබගේ හස්තය
කටු කිරුළ දැරූ, ඔබ සිරසද
හෙල්ලයෙන් සිදුරු වූ ඔබ ඇලයද
කුරුසය මත දුක් ගාවිනා ඉසිළු
ඔබගේ මුළු සිරුරමද
මට පෙන්නුව මැනවි.
ආදරණීය සමිදාණනී
මෙතුවක් කල් මා ඔබ වෙනුවෙන්
කර ඇත්තේ කුමක්ද?

**නිමේෂා මධුමාලි සමරකෝන්**
**13 ශ්‍රේණිය (කලා අංශය )**
**ශා. අන්තෝනි මහා විද්‍යාලය**
**අලගොල්ලෑව**



අරුණාළු ස
පිනිබිඳු අස
සීතලේ ගැ
සියුමැලි මල්
සුදු මීදුමින්
කඳු වැටිපෙ
සිලි සිලි හඬ
නැග එන ළ
හමා එන ම
වික සිත ව
වෙර දරණ
බිඟුන්ගේ මි
දෙසවන් ම
සිත තුළ ච
ගතට සැහැ
කොතරම් සු

**හා. ජු**

# පිපෙන මල් යාය

## සැඳෑ අසිරිය

කඹුරට ගිය ගොවි මාමල ගෙදරට එන්නේ
විහඟුන් කැල කැදලි කරා පියඹා යන්නේ
සඳ කුමරා හෙමින් හෙමින් පායා එන්නේ
රාත්‍රියේ ආරම්භය කියා පාන්නේ

**නදීකා ප්‍රියදර්ශණී**
**10 ශ්‍රේණිය**
**ශු. ජපමාල දේව මාතා දහම් පාසල - මීරිගම**

## පරිසරය

හමා එන මඳ පවනින්
ගස්කොළන් සෙළවෙයි
කුරුල්ලන්ගේ
කිචි බිචි හඬෙන් පරිසරයම රැව් දෙයි
ඇළ ගුවනේ රටාවට මෙන්
පාවෙන වළා කුළු මවයි සිතුවම්
සමිඳුනි, ඔබ මැවූ
මේ ලොවේ සුන්දරත්වය
කියා නිම කළ නොහැක මට

**තරුෂි ඊමාෂා මතුගම**
**06 ශ්‍රේණිය**
**නිර්මල හෘදයේ දහම් පාසල**
**බංඩිගොඩ (බටගම මීසම )**

## හිමිදිරි උදය

මග දිළිසෙන,
ඩ
හෙන
 කොපුල,
වෙලෙන
ළ පාමුල
ඩ නගා ලා දැල්ල
 හිරු කිරණ,
ද පවන
න්නට,
මල් ගොමුව,
යැසී රාවය
ත් මත් කරයි,
මත්කාරය
ල්ලුව
න්දරද?



**ළමා ඔබේ නිර්මාණ අප වෙත යොමු කරන්න**
**ළමා ප්‍රදීපය "පිපෙන මල් යාය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**

**ලූෂිර රජින් බෙරෙන්ජ**
**ස් වාස් කනිටු දෙව්සත්හල - මිල්ලව, කුරුණෑගල**

## සඳ ණයගැතියි!

දස මසක් කුසේ දරා
ලේ කිරි කර පොවලා
ඔබගේ සෙනෙහස මට දුන්නා
ඔබේ සෙනෙහස මා තව තවත්
දිරිමත් කළා අම්මේ


**දිනුෂ්ක බීටෝ**
**08 ශ්‍රේණිය**
**සාන්ත බෙනඩික් දහම් පාසල**
**වයික්කාල**



## තුති පුදමි

වළාකුළක සැඟවී එන
හිරු රැසින් ලොව දිදුලනා විට
මල් පිබිදෙමින් ලොව සුවඳවත් වෙන්නේ
මැවිල්ල තුළින් ඔබේ ආදරය කියා පාන්නා මෙනි
ඔබ මැවූ ලොවේ සැබෑ
සුන්දරත්වය දැකගන්නට හා එය රැකගන්නට
තෝරාගත් මා තුති පුදනෙමි
සියල්ල මැවූ දෙව්දුනි ඔබ හට .......

**ත්‍යාගා දිල්ෂාරා**
**10 ශ්‍රේණිය**
**අවිල්ලා හී සාන්ත තෙරේසා දහම් පාසල - කොටිකාවත්ත**
**(කොළොන්නාව මීසම )**



## ගම්මානයේ සුන්දරත්වය

සුන්දර දිය ඇළ තිබෙනා
මනහර කඳුවැටි තිබෙනා
ගස්වල පලතුරු පැසෙනා
ගම්මානේ ලස්සන මට දැනෙනා

**සනිතා ප්‍රභාෂි**
**04 ශ්‍රේණිය**
**සිරිකුරුස විදුහල - ගම්පහ**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 119

## **To** හෝ **for** යොදන්න.

* Shama went to the doctor **for** a check up.
ශාමා පරීක්ෂණයක් කරගැනීමට වෛද්‍යවරයා හමුවන්න ගියා.

* **To** read small letters I have to wear glasses
පුංචි අකුරු කියවීමට මට කණ්ණාඩි දාන්න ඕනා.

* I wish I had a good teacher **for** my son **to** learn English
මගෙ පුතාට ඉංග්‍රීසි ඉගෙන ගන්න හොඳ ගුරුවරයෙක් හිටියනං කියල හිතෙනවා.

* Do you wear glasses **for** reading ?
ඔයා කියවද්දි කණ්ණාඩි දානවද?

* We are going to Bandarawela **for** a holiday.
අපි නිවාඩුවකට බණ්ඩාරවෙල යනවා.

* You need a screwdriver **to** do this job.
මේ වැඩේ කරන්න ඉස්කුරුප්පු නියනක් ඕන.

* You need a screwdriver **for** this job
මේ වැඩේට ඉස්කුරුප්පු නියනක් ඕන.

## අපි ඉංග්‍රීසි භාෂාවේ වැදගත්ම වචනයක් වන **have** පිළිබඳ ඉගෙන ගනිමු

අපි කවුරුත් පාහේ **"have"** කියන වචනය දන්නවා. බොහෝ විට ඒකෙන් අදහස් වන්නේ "තියනවා" කියන අදහස. ඒත් මේ **"have"** කියන වචනයෙන් නොයෙකුත් වෙනස්, වෙනත් අදහස් මතුවෙන්න පුළුවන්.

ඒ එක්කම have කියන අදහසම ප්‍රකාශ කිරීමට සමහර විට have got කියලත් ඉංග්‍රීසි භාෂාවෙදිත් යොදනවා. අපි මේ ගැනත් ටිකක් විමසමු. ඇත්තෙන්ම have කියන වචනෙන් අදහස් කීපයක් මතුවෙන්න පුළුවන්.

1. අයිතිවාසිකම හැඟවීමේදී **have** යොදනවා.
නිදසුන් : I **have** a motorcycle
අයි හැව් අ මෝටර් සයිකල්) මට මෝටර් සයිකලයක් තියෙනවා.

My brother **has** a good car. (මයි බ්‍රදර් හැස් අ ගුඩ් කා(ර්)) මගේ සහෝදරයාට හොඳ කාරෙකක් තියෙනවා.

They **have** a good school. (දේ හැව් අ ගුඩ් ස්කූල්)
එයාලට හොඳ පාසලක් තියෙනවා.

Amali **has** two sisters. (අමාලි හැස් ටූ සිස්ටර්ස්)
අමාලිට නංගිලා දෙන්නෙක් ඉන්නවා

**have** කියන්නෙ බහු වචන තේරුමක් දෙන වචනයක්. ඒක වචන සඳහා භාවිතා කරන්නේ **has**

Aruna **has** a sports car. (අරුණ හැස් අ ස්පෝට්ස් කා(ර්) අරුණට "ස්පෝට්ස් කාර්" එකක් තියෙනවා.

Those students have very good manners. (දෝස් ස්ටුඩන්ට්ස් හැව් වෙරි ගුඩ් මැනර්ස්) ඒ ශිෂ්‍යයන්ට හොඳ ගති ගුණ තියෙනවා.

බලන්න, ඒ ඉහත වැකි හැම එකේම have (හෝ has) යොදල තියෙන්නෙ යමක් තිබෙන බව / යමක් "අයිති බව" ඇඟවීමට.

2. ඊළඟට වගකීමක් යුතුකමක් හෝ යොමුවීමක් ගැන කීම සඳහා **"have"** යෙදෙනවා. බොහෝ අවස්ථාවලදී මේ අදහස ප්‍රකාශ කිරීමේදී **have** යෙදෙන්නෙ **"to"** සමඟයි. ඒත් එහෙම වූ නැතිව යෙදෙන අවස්ථාත් තියෙනවා.

නිදසුන් : I **have to** go for a meeting.
(අයි හැව් ටු ගෝ ෆො(ර්) ද මීටිං) මට මීටිමකට යන්න තියෙනවා.

You **have to** decide the subjects you are going to study.
(යූ හැව් ටු ඩිසයිඩ් ද සබ්ජෙක්ට්ස් යූ ආ(ර්) ගොයිං ටු ස්ටඩි)
ඔබ හැදෑරීමට බලාපොරොත්තු වන විෂයය තීරණය කළ යුතුයි.

You **have to** have courage and confidence if you want to be a leader.( යූ හැව් ටු හැව් කරේජ් ඇන්ඩ් කන්ෆිඩන්ස් ටු බී අ ලීඩර්)
නායකයෙන් වීමට ධෛර්යය හා විශ්වාසය අවශ්‍යමයි.

You **have to** get the passport if you intend to fly.
(යූ හැව් ටු ගෙට් ද පාස්පෝට් ඉෆ් යූ ඉන්ටෙන්ඩ් ටු ෆ්ලයි)
ඔබ ගුවන් ගතවන්න (පියාසර කරන්න) අදහස් කරගෙන ඉන්නවනං ඔබ ගුවන් ගමන් බලපත්‍රය ලබා ගත යුතුයි.

You **have to** be on time for the film. (යූ හැව් ටු බී ඔන් ටයිම් ෆෝ ද ෆිල්ම්.)චිත්‍රපටිය සඳහා හරි වෙලාවට එන්න.

බලන්න, ඉහත වැකිවල අයිතිවාසිකමක් ගැන කියැවෙන්නේ නෑ. ඒ වැකි වලත් ප්‍රකාශ වෙන්නෙ තමන්ගෙ යුතුකම්, කළ යුතු දේවල්, වගකීම් වැනි දේ. have යෙදෙන තවත් අවස්ථා ගැන අපි පහත කතා කරමු.

# කොටස් වශයෙන් පළවන කිතුනු යොවුන් නව කථාව.

**පසුගිය සතියෙන්.....**

## පුංචි සූවාමි

වැඩිහිටි තාත්තා කෙනෙක් ලියන මේසේ ළඟ හිටගෙන. ලොකු සුවාමි නෑ කියද්දි උන්දැගේ මූහුණ මැළවිලා ගියා. ලොකු කරදරයක ඉන්න පාට තමයි පේන්න තියෙන්නෙ

''ෆාදර් මම ලොකු උදව්වක් ඉල්ල ගන්නයි ආවෙ. මම ආණ්ඩුවේ රස්සාවක් කරපු පැන්ෂන් එකක් තියන කෙනෙක් කරුණා කරලා මට ගෙවන මහළු මඩමකට යන්න උදව් කරන්න. මම හුඟක් තැන්වලින් අහල බැලුවා. වේටිං ලිස්ට් එකක් තියෙනවා කියලා නම ඇතුල් කරන්නම් කිව්වා. හදිස්සියෙන් ඇතුල් වෙන්න බෑ කාලෙකට පස්සෙ අවස්ථාවක් ලැබුනොත් දන්වන්නම් කියලා ටෙලිෆෝන් නොම්බරේ ඉල්ල ගත්තා.

''මහළු මඩම'' කියන නම කියද්දිත් ඒ තාත්තගෙ කටහඬ බිඳුන හැටි පුංචි සුවාමිට දැනුනා. ඒත් එයා කඳුළු සැළුවේ නෑ.

''ෆාදර් ඇඳුනුම්කමක් තිබුනොත් සමහර විට ගනියි. ඒකයි ලොකු ෆාදර් හමුවෙන්න ආවේ.''

මහ වෙලාවක් පුංචි සුවාමි මේ තාත්තට ඇහුම්කන් දුන්නා. තමන් පරිත්‍යාග වෙලා දරුන්ට සැප සම්පත් දුන් හැටි, ලොකු ලොකු කොලේජ්වල, කොන්වන්ට්වල බෝඩිං කරලා ඉගැන්නුව හැටි ඇවැදි බෝග දීලා ජයට මගුල් ගත්ත හැටි ඒත් අන්තිම කාලේ සැනසීමෙන් ජීවත් වෙන්න ආදරයක් නිවහනක් නැති හැටි ඒ තාත්තා විස්තර කළා.

''දරුවන්ගේ අම්මා හිටියානම් මට මෙහෙම වෙන්නෙ නෑ ෆාදර් අපි දෙන්නා අපේ වහල යට ජීවත් වෙනවා. විවාහ වුනාට පස්සේ දරුවන්ගේ ලිස්ට් එකේ අපි නෑ ඒ අයගෙ දරුවන් එක්ක යම් යම් ඉලක්ක කරා යන්න හැල්මේ දුවද්දි දෙමාපියන් වන අපි ඉබේ අමතක වෙනවා.

''විකල්පය මහළු මඩමද?''

කියන අභියෝගය පුංචි සුවාමි ගෙ හදවතින් ම නැගුනා ඒත් ඒ වචන කටින් පිට වුනේ නැහැ. ඒ අහිංසක තාත්තාගේ මූහුණ බලාගෙන

''මම මහත්තයාගේ ලොකු පුතා එක්ක මේ ගැන කතා කරන්නම් . දැන්ම තිරණයක් ගන්න එපා.''

''එපා ෆාදර් එපා එයාට හොටෙල් එකක් තියෙනවා. එයා ගෙ ඉලක්කය ඒක ඉහළම ලාබයක් ලබන තැනට අරං යන්න එයාගේ දරුවන්ව මුණ ගැහෙන්නෙ තාත්තගෙ සල්ලි මිස පිය සෙනෙහස නෙවෙයි. ඉතිං මං ගැන කවර කතාද? තමන්ගෙ දරුවන්ටවත් කාලය දෙන්න නැති මිනිහෙක් නමුත් ගේ තාත්තා ගැන හිතයිද''

කවදහරි දෙවෙනි පරම්පරාව තමන් ගෙ දෙමාපියන්ට කරන්නෙත් ඔයදේම තමා. සීයාත් ආච්චි අම්මාත් තමන්ගේ මව්පියන් හා එක්ව එකට ගත කළ ගෞරවනීය ජීවිතය පුංචි සුවාමිට මතක් වුනා. අක්කලා අයියලා සමග තමන් ද ඔවුන් රැකබලා ගැනීමට මව් පියන්ට උදවු කළ අන්දමත්, ඒ හැම විටම තමන් ගේ දරු පැටවුන් ලොකු මහත් කර ගන්න ආච්චි අම්මා දුන් සහයෝගය අම්මා කෙළෙහිගුණයෙන් යුතුව සිහිකළ හැටි පුංචි සුවාමිට මතක් වුනා. එහෙම පවුල් ජීවිතයක් මේ විදිහට කඩා විසිරුනේ කොහොමද .....

එකදාස්නමසිය හැටපහේ කතෝලික ඉස්කෝල ආණ්ඩුවට ගත්තට පස්සේ ක්‍රිස්තියානි ජීවිතය පිරිහෙන්න පටන් ගත්තා. එක අධ්‍යක්ෂ-වරයෙක් රැස්වීමකදී එහෙම කිව්වා මතකයි. ඒ අතීතයේ ජීවිත හික්මීමක් සමග ක්‍රිස්තියානි සාරධර්ම දරුවන්ට ලැබුනා. විෂය දැනුම වාගේම ජීවිතයට සාරධර්ම ඇතුල් කරගත් පුද්ගලයන් බිහි වුනා.

පියතුමකු ඒ අදහස අනුමත කළා මතකයි. පුංචි සුවාමි ඉපදුනේ ඊට දශක ගණනාවකට පස්සෙ කොහොම වෙතත් සමාජ පිරිහීම එහි උච්ඡස්ථානයට ඇවිත් පත්තරයක් අතට ගත්තොත් කියා-න්නේ අපරාධ මංකොල්ලකෑම් , ස්ත්‍රී දූෂන , ළමා අපචාර, සුදොම් ගොමෝරා වගේ.

මෙතනට ජේසුතුමා ගෙන එන්න ජේසු තුළ වෙනස්වෙන්න උගන්වන්න. සුවිශේෂ හරය මිනිසුන්ට මුණ ගැසෙන්න සලස්වන්න මාව කැඳවන්නේ පුංචි සුවාමිට කියැවුනා. **නිමි.**

**(ගරු ලිලියන් මැටිල්ඩා තන්ත්‍රිආරච්චි ශු.ප.නි. පැවිදි සොයුරිය)**

### පන්නිපිටිය මීසමේ පූජා උදව් දරුවන්ගේ දිනයක්

පන්නිපිටිය මීසමේ සියලුම දෙව්මැදුරු වල පූජා උදව් දරුවන් එක්තැන් කොට ඔවුන් දැනුම්වත් කිරීමේ වැඩ සටහනක් පන්නිපිටිය ක්‍රිස්තුරජාණන්ගේ දෙව්මැදුරේදී ඉකුත්දා පැවැත්වුණි. මීසම ප්‍රතිසංවිධානය කිරීම සඳහා ගෙන යනු ලබන වැඩ පිළිවෙල යටතේ මෙය මීසම් සේවක ගරු ටිරෝන්පෙරේරා පියතුමාගේ මඟ පෙන්වීම යටතේ මීසම් සහයක ගරු දිනේෂ් කීර්ති සිංහ පියතුමන් විසින් මෙහෙයවනු ලැබීය. **ක්‍රිස්ටෝපර් රණසිංහ**



**මැවිල්ලේ අසිරිය**

ෂෙනාලි නිශාරා

07 ශ්‍රේණිය

සාන්ත ආනා දහම් පාසල - තලවිල

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**මුහුදු වෙරළේ අසිරිය**

ෆියෝරි නතාෂා

02 ශ්‍රේණිය

සාන්ත මරියා දහම් පාසල

මාරවිල



**මෝස්තරයක්**

ෂෙහන් මදුවන්ත

06 ශ්‍රේණිය

ලූර්දු දේව මාතා

දහම් පාසල

නාන්තන්ඩිය



**ගිරා රංචුවක්**

චමාලි එරන්දිකා

07 ශ්‍රේණිය

දංකොටුව මහා විදුහල

## පුංචි අපේ චිත්‍ර පිටුව

**අපේ පල්ලිය**

ඒ සඳුනි සාචින්ද්‍යා

04 ශ්‍රේණිය

ආරෝග්‍යමාතා දහම් පාසල - හබරන



**මාළු ටැංකියක්**

ශෙනාල් ප්‍රනාන්දු

සින්ඩ්‍රෙල්ලා

ළදරු පාසල

මොරටුව



# ශු. හර්මස් මුනිතුමා (Hermes)

සුදුවර චරිත



දෙවන සියවස අග භාගයේදී ජීවත් වූ සභා පියවරු අතර ඉතා ප්‍රසිද්ධ අයෙකි. ක්‍රි.ව. 154 දී මිය ගිය පළමු වන පියුස් පාප් තුමාගේ සහෝදරයෙක් ලෙස මෙතුමා හඳුන්වයි. තවද ක්‍රි. ව. 150-200 ත් අතර ජීවත් වූ අයෙකු ලෙසද අනුමාන කරයි. මොහුගේ ලියැවිලි පරීක්‍ෂා කිරීමේදී පෙනී යන්නේ මෙතුමා ග්‍රීක් ආභාෂය ලත් ජුදෙව්වෙකුගේ ස්වරූපයයි. හර්මස් සභා පියාගේ ලිපිය හඳුන්වා ඇත්තේ හර්මස්ගේ එඬේරා ලෙසයි (**The Shepherd of Hermas**). මෙම ලිපිය දේවානුභාවයෙන් ලියූ ලිපියක් ලෙස සභා ඉතිහාසයේ මුල් කාලයේ පිළිගෙන ඇත (**Moratorian Canon**). මෙහි සමහර කොටස් කියවීමට හා භාවනාවට යොදාගත් බව ඉතිහාසයේ සඳහන් වේ. මෙම ග්‍රන්ථයේ සදාචාරය ගැන වටිනා ඉගැන්වීම් ක්‍රිස්තියානින් ලෙස අලුතින් ධර්මය වැළඳ ගන්නා අය සඳහා ඉදිරිපත් කරයි. මෙම ග්‍රන්ථය කොටස් 03 කින් සමන්විතය.

(1) මෙහි පළමු කොටස සිහින දර්ශන 5 කින් සමන්විතය. කිතුනු සභා මාතාව ඔහු ඉදිරියේ මැවීපෙනෙන අතර 5 වන දර්ශනයේදී දෙවියන්වහන්සේගේ දූතයෙකු එඬේරකුගේ විලාසයෙන් පැමිණ පවු කමාව ලබා ගැන්මට පෙර කළ යුතු දෑ ගැන කියා දෙයි (මනස්ථාපනයට කැඳවයි).

(2) මෙම කොටසින් කිතුනුවන්ගේ හැසිරීම පාලනය කරනු වස් මෙතුමා නියෝග 12 ක් ඔවුන්ට පෙන්වා දී ඇත. (**Commands or Mandates**)

(3) මෙම කොටසේ ඉතා බලවත් ප්‍රතිරූප ගණනාවක් මඟින් ක්‍රිස්තියානි ප්‍රතිපත්ති මොනවාදැයි පැහැදිලි කිරීමට කතුවරයා උත්සාහ දරයි. මෙම කොටසේදී මනස්ථාපනයේ දූතයෙකුගේ පැමිණීම සඳහන් වේ.

ඇ. මෙම ලිපියේ සඳහන් දේවධාර්මික ඉගැන්වීම්
මෙම ග්‍රන්ථයේ අඩංගු මූලික ඉගැන්වීම් 4 කි.
1. මනස්ථාපනය පිළිබඳ ඉගැන්වීම්
2. ක්‍රිස්තු වේදී ඉගැන්වීම්
3. සභාව පිළිබඳ ඉගැන්වීම්
4. ප්‍රසාද ස්නාපනය පිළිබඳ ඉගැන්වීම්

මෙම ග්‍රන්ථයේ මූලිකව වශයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ සමාව දීම ගැන සඳහන් වේ. සමගි සන්ධානයේ සක්‍රමේන්තුව ගැන මූලික අධ්‍යයනයක් කිරීමේදී මෙම කෘතිය වැදගත් බව සභාව පිළිගනියි. දෙවන සියවසේ රෝමයේ විසූ සමහර කිතුනු සංසවල ඇති වූ ප්‍රශ්න වලදී පිළිතුරු සපයා ඇත්තේ මෙම ලිපිය මගින්ය. මේ අතර රෝමය දූෂිත නගරයක් වන බවත් ක්‍රිස්තු කැඳවීම තුළ හිතට එකඟව ජීවත් වීම සඳහා එහි අපහසු කම් ඇති බවත් සඳහන් කරයි. ඊට හේතුව වන්නේ ප්‍රසාද ස්නාපනය මඟින් සැමට පව් කමාව ලැබෙන බවත් පව් කමාව ලැබෙන්නේ ප්‍රසාද ස්නාපනය තුළින් පමණක් බවත් රෝම සංසයේ සමහර අයගේ මතය වීමයි. එම නිසා රෝමයේ බොහෝ දෙනා ප්‍රසාධ ස්නාපනය ලබා ගැනීම මරණය දක්වා කල් දැමූ බව සඳහන් වේ. මේ නිසා හර්මස්ගේ එඬේරා කෘතිය තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ සත්‍ය වූ ඉගැන්වීම හා සමාව දීමේ මහත් ක්‍රියාව ගැන විශේෂ අවධානයක් යොමු කර තිබේ. පසුතැවිලි වන සැමට සමාව ලැබෙන බව පොදුවේ පෙන්වා දෙන මෙම ග්‍රන්ථය පව් කමාව ලබා ගැන්ම කෙනෙකුගේ ගැළවීම තීරණය කිරීමේ සාධකයක් බවද පෙන්වා දෙයි. මේ අනුව පව් කමාව පිළිබඳ මෙහෙය අඩංගු කරුණු කීපයකි.

1. ප්‍රසාද ස්නාපනයෙන් පසුව නැවතත් පව්වලට මනස්ථාපනය තුළ සමාව ලැබෙන බව
2. පව් කමාවේ විශ්වීය භාවය හා පව්කරුවන් සියලුම දෙනාට මනස්ථාපනය තුළ සමාව ලැබෙන බව
3. මනස්ථාපය වීමේ වැදගත්කම හා එයට ප්‍රතිචාර දැක්වීමේ සලකුණක් ලෙස ජීවිත වෙනසක් ඇතිකර ගන්නා බවට පොරොන්දුවීමේ වැදගත් කම
4. මනස්ථාපනයේ අරමුණ සිත් හැරීමක් ඇති කර ගැන්ම බව
5. ප්‍රසාද ස්නාපනය තුළ ශුද්ධවූ බලයෙන් පව් කමාව ලැබෙන බවත්, මේ ශුද්ධාත්ම බලයේ ආනුභාවයෙන්ම මනස්ථාපනය තුළ ගැලවීම ලැබෙන බව
6. ශු. සභා මාතාව හා සමාව දීමේ සක්‍රමේන්තුව අතර ඇති සම්බන්ධතාව

මෙලෙස ශුද්ධවූ සභාව ගැළවීම දානය කිරීමේ මූලික හා අනිවාර්යම සංස්ථාව ලෙස දක්වයි. පව් කමාව සඳහා සභා නායකයන්ගේ යාච්ඤාවේ වැදගත්කමද මෙතුමා පෙන්වයි.

අසේල දසනායක විසිනි

## ජාතික කතෝලික ලේඛක හවුලේ 2013 සාහිත්‍ය තරගාවලියේ ළමා අංශයේ ප්‍රතිඵල

ළමා නිර්මාණ (සිංහල)
- ප්‍රථම ස්ථානය - මලීෂා ලක්ෂාණි - ලොයොලා විදුහල (බෝපිටිය ශාඛාව) 09 ශ්‍රේණිය

- දෙවන ස්ථානය - හිරුණි රංසිකා මල්ෂාණි
- සා. සෙබස්තියන් බාලිකා විදුහල (කඳාන) 09 ශ්‍රේණිය

- තෙවන ස්ථානය (2 කි) - සඳුෂා ප්‍රනාන්දු - සා. මරියා දහම් පාසල කටුකුරුන්ද මොරටුව - 09 ශ්‍රේණිය

එච්.ඩී. තිළිණි චේතනා ප්‍රසාදිනී - දංකොටුව බාලිකා විදුහල 09 ශ්‍රේණිය

කනිෂ්ඨ කෙටිකතා ( සිංහල)
ප්‍රථම ස්ථානය - නවංජනි තාරිකා ප්‍රනාන්දු - 13 ශ්‍රේණිය දංකොටුව බාලිකා විදුහල

දෙවන ස්ථානය - අදිතා කුමාරසිංහ - 11 ශ්‍රේණිය ගොන්සාල්වෙස් දහම් පාසල - බෝලවත්ත

තෙවන ස්ථානය - ආර්.ජී. ඉෂාර ලක්ෂිත - 12 ශ්‍රේණිය වෙන්/ජෝශප් වාස් ජාතික පාසල - වෙන්නප්පුව

**සී.ආර්. ඩික්සන් ඇන්ටනි**

## ජිම්නාස්ටික් ශූරියක්




පන්නිපිටිය ක්‍රිස්තුරාජ විද්‍යාලයේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සචිනි කෞශල්‍යා සිසුවිය 2013 සමස්ත ලංකා පාසල් ජිම්නාස්ටික් තරගාවලියේ වයස අවු: 17 න් පහළ දක්ෂතම ක්‍රීඩිකාවට හිමි පදක්කම හිමි කරගැනීමට සමත් විය.


ඇය මෙම තරගාවලියේදී තරග ඉසව් හතරකින් ප්‍රථම හා දෙවන ස්ථානයන් ජයග්‍රහණය කිරීමට සමත් වූවාය. ජිම්නාස්ටික් ක්‍රීඩාවෙන් පෙළහර පාන සචිනි ට ළමා ප්‍රදීපය සුබ පැතුම්. **කුමර**

**ප්‍රහේළිකාව අංක 41 නිවැරදි ව පුරවා එවූ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ගේ නම් හා ප්‍රහේළිකා අංක 42 ලබන සතියේ.**

**2013 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ කතෝලික ධර්මය විෂය සඳහා පෙනී සිටින දුවලා පුතාලා වෙනුවෙන් විශේෂිත උපදෙස් මාලාවක් ලබන සතියේ ළමා ප්‍රදීපයෙන් බලාපොරොත්තු වන්න.**



## සුදතුම් වරම් ලැබීම



වයික්කාල මීසමේ ළමෝ 68 ක් පසුගියදා සුදතුම් වරම් ලැබීය. වයික්කාල මීසමට අයත් සින්ද්‍රාතිය, සින්ද්‍රාතිමාතා දෙව් මැදුරේදී හලාවත රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පදවි පරිපාලක අතිගරු පැට්‍රික් විජේසිංහ පියතුමාගේ සහභාගීත්වයෙන් දේව මෙහෙය පැවැත්වුණි. මීසම් සේවක ගරු ෆිලික්ස් කොළඹගේ පියතුමාගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ මෙදින කටයුතු සංවිධානය කෙරිණි. රදගුරු හිමිපාණන් , ගරු පියතුමන්ලා ළමුන් සුදනම් කළ පැවිදි සොයුරියන් දහම් ගුරු වරුන් හා අභිවෘද්ධි ආලේපය ලැබූ ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයා රුවකට පෙනී සිටි අයුරු.

**සටහන :- දුලක්ෂි පිරිස් / සේයා - මාර්ෂල් කොළඹගේ**


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
මෝසෙස්
30
චිත්‍ර කතා රචනය: ආනන්ද කීල්දෙරා
දෙබස් හා චිත්‍ර: ඇස්.ඒ.පී. සපුආරච්චි
මා සහෝදර මෝසෙස් නුඹලා වෙනුවෙන් ෆාරාවෝ රජු හමුවෙනු ඇති... එහිදී අප ඔහුට කියා සිටිනවා.. අප සැමවම නිදහස් කර ගැනීමට දෙවියන් වහන්සේ.. මෝසෙස්ව මෙහි එවූ බව......
මෝසෙස් හා ආරොන් ෆාරාවෝ රජු ඉදිරියේ
අප මෙහි පැමිණියේ අප සවාමිවූ දෙවියන් ..වහන්සේගේ.. ..අණ පරිදියි..
උන්වහන්සේ කියා සිටිනව මෙහි සිටින වහල් ජනතාව නිදහස් කරන ලෙස.. ඔවුන්ට ඔවුන්ගේ නිදහසේ... ජීවත්වීමට ඉඩහරින ලෙස
මොනවා..?
මට අණ දෙන්න නුඹලා කවුද? නුඹලා කවුරු වුනත් මගේ වහලුන් කලිවලි.. වෙන දේවල්.. කරන්න එපා. නුඹලාගේ දෙවියන් කවුද කියා මා දන්නේ නැද..
මා නුඹලාගේ අණට කීකරු වන්නේ නැහැ. එපමණක් නොව මා.. නුඹලාට ආපසු යාමටද ..ඉඩ නොදෙමි..
අප මේ කරන්නේ දේව අණට කීකරුවීම පමණයි උන්වහන්සේ අපට පෙනී සිට.. ඔබ හමුවී මෙසේ කථා කරන්ට කීවා.. උන්වහන්සේට අකීකරු වුනොත් උන්වහන්සේ ..අපව විනාශ කරාවි...
එනිසා දේව නියමය පරිදි.. අපගේ හෙබ්‍රෙව් වහලුන් සමග කාන්තාරයට ගොස් උන්වහන්සේට පූජා ඔප්පු කිරීමට අපව.. නිදහස් කරන්න....
ෆාරාවෝ එයින් ඉමහත් කෝපයට පත්විය...
මුං කවුද.. මට අණ කරන්න... මේ මිනිසුන් දෙදෙනා අද පටන් ඊශ්‍රායෙලි වරු වැඩ අතපසු කරනවා.
හොඳයි.. මම මුංට හොඳ පාඩමක් උගන්නම්කෝ.
සෙනෙවිය වහා වහල් නායකයන් ..මෙහි කැඳවනු..

# ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම්

ළමා ප්‍රදීපය



කුරණ සාන්ත ජූඩ් විදුහලේ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත් දරු දැරියන් ළමා ප්‍රදීපය සඳහා ඡායාරූපයකට මුහුණ දුන් අයුරු. ( ටී. සුනිල් ප්‍රනාන්දු)



නාත්තන්ඩිය, තල්ගස්අගාර දහම් පාසලේ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත් දරු දැරියන් ළමා ප්‍රදීපය සඳහා ඡායාරූපයකට මුහුණ දුන් අයුරු. ( ශ්‍රියාංගණී ෆිලීෂියා )



මැල්සිරිපුර මීසමේ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත් දරු දැරියන් ළමා ප්‍රදීපය සඳහා ඡායාරූපයකට මුහුණ දුන් අයුරු. ( නිමල් ඒ. අල්මේදා)



දුන්ගාල්පිටිය ශු. මරියමග්දලේනා දහම් පාසලේ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත් දරු දැරියන් ළමා ප්‍රදීපය සඳහා ඡායාරූපයකට මුහුණ දුන් අයුරු. ( සෙබස්තියන් පෙරේරා)